# පොදු දේපළ අයථා පරිහරණය පිළිබඳ නිරීක්ෂණ තත්ත්ව වාර්තා

## පොදු දේපළ අයථා පරිහරණය පිළිබඳ නිරීක්ෂණ (අංක- 02) 2014.12.05

### දිස්ත්‍රික් ගණකාධිකාරීවරුන් දේශපාලන රැස්වීමක් සඳහා කැඳවීම

ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අනුමැතියකින් තොරව සියලුම දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රධාන ගණකාධිකාරීවරයා ඇතුළු ගණකාධිකාරී නිලධාරීන් අයවැය සාකච්ඡාවක් සඳහා යැයි පවසමින් අරලියගහ මන්දිරයට කැඳවා තිබේ.

අයවැය පිළිබඳව සාකච්ඡා කිරීමට ඔවුන් මුදල් අමාත්‍යාංශයට හෝ මහා භාණ්ඩාගාරයට නොකැඳවා ඔවුන්ට අරලියගහ මන්දිරයට පැමිණෙන ලෙස ආරාධනා කිරීම සැකයට හේතු වන කාරණයකි. මැතිවරණවලදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ලෙසත් සහකාර තේරීම් භාර නිලධාරීන් ලෙසත් අතිශය තීරණාත්මක රාජකාරියක් ඉටු කරන මෙම නිලධාරීන් මෙලෙස අපේක්ෂකයකුගේ රැස්වීමකට සහභාගී වීම, මැතිවරණයේ සුපිළිපන්භාවයට හානි කර වනු ඇත. එමෙන්ම එය මැතිවරණ ප්‍රතිපලයේ විශ්වසනීයත්වයටද තදබල අභියෝගයක් වනු ඇත.

මෙම නිලධාරීන් අවංකව රාජකාරී කරනු ලබන නිලධාරීන් වුවද ඔවුන් මෙවන් සාකච්ඡාවකට සහභාගීවීම හරහා ජනතාව තුළ අවිශ්වාසයක් ඇති වීම වළක්වාලිය නොහැක.

එබැවින්, වහාම මේ පිළිබඳව සොයා බලා පියවර ගන්නා ලෙස අපි ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

### 'ශ්‍රී ලංකා යූත්' සංවිධානය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රචාරක කටයුතුවල

රජය යටතේ ඇති 'ශ්‍රී ලංකා යූත්' සංවිධානය මේ වනවිට නිල් බලකාය සමග එක්සත් ජනතා නිදහස් සංධානයේ ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධව සිටින බව අප විසින් නිරීක්ෂණය කර ඇත.

ශක්‍යතා ප්‍රවර්ධන පුහුණුවකට යැයි කියමින් 'ශ්‍රී ලංකා යූත්' සංවිධානය උතුරු පළාතේ තරුණයන් 100ක් කැඳවා මහින්ද රාජපක්ෂ මහතාගේ ඡන්ද ප්‍රචාරක කටයුතු කරගෙන යන ආකාරය පිළිබඳව උපදෙස් දී ඇත. කිලිනොච්චිය තරුණසේවා මධ්‍යස්ථානයේදී පැවති මෙම සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලංකා යූත් හි නිලධාරී පිරිසක් (සියලු නම් අප සතුය) දීර්ඝ දේශන පවත්වා මහින්ද රාජපක්ෂ දිනවීමට කටයුතු කළ යුතු ආකාරය ගැන උපදෙස් දී ඇත. එමෙන්ම එම තරුණයන් යොදවා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තරුණයන් 100 බැගින් පුහුණු කිරීම ඔවුන්ගේ සැලසුම වී තිබේ.

මේ සම්බන්ධයෙන් වහාම මැදිහත් වී, ශ්‍රී ලංකා යූත් ආයතනය මෙලෙස මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධවීම අත්හිටුවන ලෙස අපි ඔබගෙන් ඉල්ලා සිටිමු.

**පාසල් දේශපාලන කටයුතුවලට**

වයඹ පළාතේ අධ්‍යාපනය නගාසිටුවීම සඳහා පාසල් සංවර්ධන සමිති ශක්තිමත් කිරීමේ මුවාවෙන් පාසල් සංවර්ධන සමිති හා දෙමාපියන් කැඳවා දේශපාලන රැස්වීම් සංවිධානය කිරීමට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ඇන්තනි වික්ටර් පෙරේරා මහතා කටයුතු කර ඇති බව අප නිරීක්ෂණය කර ඇත.
පාසල් සංවර්ධන සමිති කැඳවන ලෙස ඔහු හලාවත හා පුත්තලම ප්‍රදේශවල සියලුම පාසල්වල විදුහල්පතිවරුන්ට දැනුම් දී තිබේ. ඇතැම් විදුහල්පතිවරුන් මීට විරෝධය පළ කර ඇති බවද දැනගන්නට තිබේ.

මීට අදාළව ඇමතිවරයා විසින් යැවූ ලිපිය මේ සමග අමුණා ඇත.

වහාම මේ තත්ත්වය වළක්වාලීමට පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිමු.

**නගරසභා දේපළක් අයථා ලෙස පරිහරණය කිරීම**

එළැඹෙන ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාට සහය පළකරන බව පැවසීම සඳහා 'කුරුණෑගල නිදහස් නීතිඥ සංවිධානය' නැමැති සංවිධානයක් විසින් පසුගිය දෙසැ 27 දා පස්වරුවේ කුරුණෑගල මහ නගර සභා ශ්‍රවණාගාරයේදී මාධ්‍ය හමුවක් පවත්වනු ලැබීය.

මෙම මාධ්‍ය හමුව පැවැත්වීමට යොදාගෙන තිබූ කුරුණෑගල මහ නගර සභාවේ ශ්‍රවණාගාරය එහි අභ්‍යන්තර කටයුතු සඳහා පමණක් යොදාගැනෙන මහනගර සභාවේ ප්‍රධාන පරිපාලන ගොඩනැඟිල්ලේ ඉහළ මාලයේ පිහිටුවා ඇති එකකි. මෙම ශ්‍රවණාගාරය කුලී පදනම මත බාහිර පාර්ශ්වයන්ට ලබාදීමට කුරුණෑගල මහනගර සභාව විසින් කටයුතු නොකරයි.

මෙය පොදු දේපළ අයථා පරිහරණයක් වන අතර මේ ආකාරයට මෙම ශ්‍රවණාගාරය මුදල් ගෙවා හෝ යොදාගැනීමට සාමාන්‍ය ජනතාවට නොහැකි බව අප කළ විමසුමේදී නගරසභාවේ නිලධාරියෙක් ප්‍රකාශ කළේය.

## **පොදු දේපළ අයථා පරිහරණය පිළිබඳ නිරීක්ෂණ (අංක- 03)** 2014.12.12

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජනාධිපතිධුර අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් ඊයේ (11) අනුරාධපුරයේදී පැවති රැස්වීමේදී මැතිවරණ නීති කඩවීම් රැසක් සිදුවූ බව අප විසින් නිරීක්ෂණය කරන ලදී.

එහිදී මහජන මුදලින් නඩත්තු වන ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනී සේවය මගින් එය සජීවී ලෙස විකාශය කිරීමට කටයුතු යොදා තිබුණි. රාජ්‍ය මුදල් වැය කරමින් එලෙස ජනාධිපති අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය නාලිකාවක් යොදාගැනීම මැතිවරණ නීති පැහැදිලි ලෙසම උල්ලංඝනය කිරීමකි.

වහාම මේ පිළිබඳව සොයා බලා ඊට එරෙහිව පියවර ගන්නා ලෙසත්, එහිදී එම ආයතනවලට වැය වූ මුදල එම ආයතනවල සභාපතිවරුන් ඇතුළු බලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා

සිටිමු. එසේම ඉදිරියටත් රාජ්‍ය නාලිකා මෙලෙස කටයුතු කළහොත් එක් අපේක්ෂකයකුට පමණක් වාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් එය වැළැක්වීමට පියවර ගන්නා ලෙසද ඉල්ලා සිටිමු. මෙම සජීවී විකාශය සඳහා රුපියල් දසලක්ෂ 2.1ක මුදලක් වැය වූ බව එහි සේවකයෝ පවසති.

### ලංගම බස්රථ යොදාගැනීම

ඉහත රැස්වීමට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ජනතාව කැඳවාගෙන ඒම සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ 1100කට වැඩි සංඛ්‍යාවක් යොදාගෙන තිබූ බව අප වෙත වාර්තා වී තිබේ. එම බස් රථ යොදාගැනීම වෙනුවෙන් එම ආයතනයට මුදල් ගෙවා ඇති බවක් දැනගන්නට නැත.

හැටන්, මඩකලපුව, කිලිනොච්චිය, යාපනය, දඹුල්ල, උඩහමුල්ල, මොරටුව, කෑගල්ල, පොළොන්නරුව, මහියංගනය, මට්ටක්කුලිය, බදුල්ල, කැකිරාව, හොරොව්පතාන, අනුරාධපුරය, වව්නියාව, ඇතුළු දිවයිනේ ප්‍රදේශ රැසකින් මෙම බස් රථ කැඳවා තිබිණි.

ලංගම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වෘත්තීය සමිතියේ උපදෙස් මත මෙම බස්රථ පෙරේදා රාත්‍රියේ සිටම අනුරාධපුරයට කැඳවා තිබුණු අතර, බස් රථ ගණනාවක් අනුරාධපුරය නගරය අවට ගාල් කර තිබෙන අයුරු දැකගත හැකි විය.

මෙසේ බස් රථ විශාල සංඛ්‍යාවක් මෙම කටයුත්තට යොදවා තිබීම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාමාන්‍යපෙළ විභාගයට පෙනී සිටින සිසුහු දැඩි අපහසුතාවට පත් වූහ. ඔවුන් බොහෝ දෙනෙකුට ලොරි රථ, ට්‍රැක්ටර් ආදියෙහි නැගී විභාගයට පැමිණීමට සිදුවිය.

මෙම තත්ත්වය ඉදිරි ප්‍රචාරක කටයුතුවලදීද සිදු විය හැකි බැවින්, ජනතාව අපහසුතාවට ලක් වන අයුරින් බස් රථ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීම වළක්වාලීමට අවශ්‍ය ගන්නා ලෙසද ඉල්ලා සිටිමු.

### උතුරුමැද ආණ්ඩුකාරවරයා දේශපාලන කටයුතුවල

මේ අතර උතුරුමැද පළාතේ ආණ්ඩුකාර කරුණාරත්න දිවුල්ගනේ මහතාද ඉහත සඳහන් ප්‍රචාරක රැස්වීමේ වේදිකාවෙහි සිටියේය. ආණ්ඩුකාරවරුන්ට මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරත විය නොහැකි බව මින් පෙරද ඔබ විසින්ම තහවුරු කොට තිබියදී ඉහත ආණ්ඩුකාර වරයා මේ අන්දමින් ක්‍රියා කිරීම බලවත් වරදක් වන අතර, ඒ සම්බන්ධයෙන් නොපමාව පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

## පොදු දේපළ අයථා පරිහරණය පිළිබඳ නිරීක්ෂණ (අංක- 04) 2014.12.12

### විශ්‍රාමික රජයේ සේවකයන්ට නොමිලේ ජංගම දුරකථන ලබා දීම

මහින්ද චින්තන ඉදිරි දැක්මේ ප්‍රතිඥාවක් යැයි පවසමින් විශ්‍රාමික පුරවැසියන්ට ජංගම දුරකථන බෙදාදීමේ වැඩපිළිවෙළක් රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යූත් හා මොබිටෙල් ආයතනය සමඟ ඒකාබද්ධව රට පුරා ආරම්භ කර ඇත.

මැතිවරණයක් ප්‍රකාශයට පත්ව තිබියදී රාජ්‍ය ආයතන 3ක් සෘජුවම සම්බන්ධ වී සිදුකරන මෙම කටයුත්ත පැහැදිලිවම එක් අපේක්ෂකයකුට වාසි සැලසෙන අන්දමට රාජ්‍ය දේපළ යොදාගැනීමක් මෙන්ම ඡන්දය ලබාගැනීමේ අපේක්ෂාවෙන් විශාල පිරිසකට තිළිණ ලබාදීමේ වැඩපිළිවෙළක් බව අපගේ නිරීක්ෂණයයි.

මෙම වැඩසටහන පිළිබඳව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කර තිබේ. උත්සවාකාරයෙන් ජංගම දුරකථන පිරිනැමීමේ අවස්ථා රට පුරා විවිධ ස්ථානවල පවත්වා ඇති අතර ඉදිරියේදීද එවැනි උත්සව පැවැත්වීමට නියමිත බව වාර්තා වී ඇත. මේ අවස්ථා සඳහා කැබිනට් ඇමතිවරුන් ඇතුළු ආණ්ඩු පක්ෂයේ දේශපාලන නියෝජිතයන් මෙන්ම දිසාපතිවරුන් ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන්ද සහභාගී වී ඇත. මෙම උත්සව සෘජුවම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරයේ කොටසක් බව පැහැදිලිය.

### ජංගම දුරකථන බෙදාදීමේ උත්සවවලට රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ වීම

මෙවැනි උත්සවයක් අනුරාධපුරයේ සී.ටී.සී. (CTC) ශාලාවේ දී ඊයේ (13) පෙරවරුවේ පවත්වා ඇත. එය සංවිධානය කර තිබුණේ අනුරාධපුර දිසාපතිවරයාගේ උපදෙස් පරිදි අතිරේක දිසාපතිවරයා විසිනි. ඔහු විසින් රැස්වීමට විශ්‍රාමිකයන්ට හා දේශකයන්ට ආරාධනා කිරීම ඇතුළු සියලු සංවිධාන කටයුතු සිදු කර තිබේ.

ඒ අනුව එහි පැමිණි අනුරාධපුර සම්බුද්ධ ජයන්ති විහාරයේ විහාරාධිපති නුගේකාන්ගේ පඤ්ඤානන්ද හිමියන් විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා දැඩි විවේචනයට ලක් කරමින් මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දෙන ලෙස ප්‍රසිද්ධියේ පවසා ඇත. මෙයට සිය අකමැත්ත පළ කරමින් විශ්‍රාමිකයන් පිරිසක් දිවා ආහාර ද නොගෙන පිටව ගොස් තිබේ.

මාතර දී පැවති මෙවැනිම උත්සවයක දී රංජිත් සියඹලාපිටිය අමාත්‍යවරයා මහින්ද රාජපක්ෂ මහතාට කළගුණ සැලකීමත් ලෙස ඡන්දය දෙන්නැයි ඉල්ලා සිටි බව අප විසින් නිරීක්ෂණය කර තිබේ.

මැතිවරණයේ තේරීම් භාර නිලධාරීන් පවා සෘජු ලෙස සම්බන්ධ කරගනිමින් සිදුකරන මෙම නීති විරෝධී ක්‍රියාදාමය මැතිවරණයේ සුපිළිපන්බවට දැඩි අභියෝගයකි. එබැවින් මැතිවරණ කටයුතු අවසන් වන තුරු මෙම වැඩපිළිවෙළ අත්හිටුවීමට කටයුතු කරන මෙන් අපි ඉතා අවධාරණයෙන් ඉල්ලා සිටිමු.

### නීති විරෝධී කාර්යාල

මැතිවරණ නීතියට අනුව ඔබ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛවල උපදෙස් වලට පටහැනි ලෙස දිස්ත්‍රික්ක ගණනාවක මැතිවරණ ප්‍රචාරක කාර්යාල නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ඉදිකර තිබෙනු නිරීක්ෂණය කළ හැකි විය.

මීගමුව කුරණ මග දෙපස කාර්යාල 02ක් ඉදිකර තිබීමත් ඉන් මීටර් 50ක් පමණ ඔබ්බෙන් තවත් කාර්යාලයක් ඉදිකර තිබීමත් උදාහරණ ලෙස පෙන්වා දිය හැක.වසා දැමුණු ගොඩනැගිලි මෙන්ම කිසිදු ගොඩනැගිල්ලක් නොමැති ඉඩම්වල පවා කාර්යාල ඉදිකර තිබෙන ආකාරය අප නිරීක්ෂණය කළ අතර ඒවා ඡායාරූප සමග ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු.

### ශ්‍රී ලංකා යුත් මැතිවරණ ප්‍රචාරණයේ

තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා යුත් ආයතනය මේ වනවිට සෘජු ලෙසම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතව සිටී.

ශ්‍රී ලංකාව පුරා සිටින තරුණ සේවා නිලධාරීන් අවිස්සාවේල්ල බටංගල පිහිටි ශ්‍රී ලංකා යූත් පුහුණු මධ්‍යස්ථානයට කැඳවූ එහි බලධාරීන් ඔවුනට පසුගිය දෙසැම්බර් 11 සහ 12 යන දෙදින තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කළ යුතු ආකාරය ගැන දෙදින පුහුණුවක් ලබා දී ඇත. මෙම පුහුණුව ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා යූත් සභාපති ලලිත් පියුම් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙනි.

දෙදින පුහුණුවෙන් පසු ආපසු තම බල ප්‍රදේශවලට ගොස් තරුණයන් 100 බැගින් තෝරාගෙන ඔවුනට පුහුණුවක් ලබා දී මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල නිරතවන ලෙස උපදෙස් දී තිබේ.

ශ්‍රී ලංකා යූත් ඇතුළු මෙම නිලධාරීන් සියලු දෙනා මහජන මුදලින් නඩත්තුවන බැවින් ඔවුන් මෙලෙස මැතිවරණ කටයුතුවල නිරත වීම වළක්වාලීමට පියවර ගන්නා ලෙස අපි ඔබගෙන් ඉල්ලා සිටිමු.

**නීති විරෝධි කටවුට් බැනර් සහ තොරණ**

ඔබගේ නියෝගය පරිදි බොහොමයක් පොලිස් ස්ථානාධිපතිවරු තමන්ගේ බල ප්‍රදේශවල ප්‍රදර්ශනය කළ කටවුට් සහ බැනර් ඉවත් කිරීමට පියවර ගනිමින් සිටිති. මෙය අගය කළ යුතු කාර්යයකි.

එහෙත් තවමත් පහත දැක්වෙන ස්ථානවල අති දැවැන්ත කටවුට් බැනර් සහ තොරන් ප්‍රදර්ශනය වන අතර ඒවාද ඉවත් කිරීමට පියවර ගන්නා ලෙසද අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

1 පෑලියගොඩ

කටුනායක අධිවේගී මාර්ගය ආරම්භවන ස්ථානයේ පිහිටි අති දැවැන්ත කටවුට් එක

2 මාරවිල

මාරවිල සුහද ටයර් සෙන්ටර් එක ඉදිරිපිට පිහිටි කටවුට් එක

3 හලාවත

හලාවත නගරයට පිවිසෙන ස්ථානයේ මහා මාර්ගය හරහා ඉදිකර ඇති තොරණ හා නගරය පුරා ඇති කටවුට්

4 නොච්චියාගම

නොච්චියාගම සමනළ සමූහ ව්‍යාපාරය ඉදිරිපිට මාර්ගයේ ඉදිකර ඇති කටවුට්

5 අනුරාධපුරය

අනුරාධපුර ලංගම බස් ඩිපෝව ඉදිරිපිට හා යාපනය හන්දිය අසල ඇති දැවැන්ත කටවුට් එක

## පොදු දේපළ අයථා පරිහරණය පිළිබඳ නිරීක්ෂණ (අංක- 05) 2014.12.22

### මැතිවරණ කාර්යාල මුවාවෙන් සිදු කරන නීති විරෝධී ප්‍රචාරණ කටයුතු

බස්නාහිරට පළාතේ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල මැතිවරණ නීතියට සහ ඔබ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි ලෙස නීති විරෝධීව ඉදි කළ මැතිවරණ ප්‍රචාරක කාර්යාල ගණනාවක් පිළිබඳ තොරතුරු අප වෙත ලැබී තිබේ.

කාර්යාල මුවාවෙන් ඉදිකර ඇති එම ස්ථාවලින් බොහොමයක් කිසිදු ආකාරයකින් කාර්යාල ලෙස භාවිත නොකරන අතර, වසා දැමුණු ගොඩනැගිලි, රේස් බුකි මෙන්ම ගොඩනැගිල්ලක් පවා නොමැති හිස් ඉඩම්වලද ඉදි කර තිබෙනු අප විසින් නිරීක්ෂණය කර ඇත. හාස්‍යජනක කරුණ නම්, මාර්ගය අසල ඇති විදුලි ට්‍රාන්පෝමර් පවා ආවරණය වන අයුරින් ඇතැම් ඒවා ඉදි කර තිබීමය. මෙවැනි ස්ථාන ගණනාවක් අප විසින් ඡායාරූපගත කර ඇති අතර, එම ඡායාරූපද මේ සමග ඔබ වෙත යොමු කරමු.

කොළඹ නැගෙනහිර, කොළොන්නාව, මිනුවන්ගොඩ, දිවුලපිටිය, මීගමුව වැනි ප්‍රදේශවල මෙම තත්ත්වය වඩාත් කැපී පෙනේ. මීට අමතරව මහා පරිමාණයේ කටවුට් විශාල ප්‍රමාණයක් තවමත් කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශවල ප්‍රදර්ශනය කරන අයුරු දැකිය හැකිය.

මේ බව අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත දන්වා, එම කාර්යාල ඉවත් කිරීමට පියවර ගන්නේ නම් කෘතඥ වෙමු. අවශ්‍ය වෙතොත් මැතිවරණ නිලධාරීන් සමග ගොස් අදාළ ස්ථාන පෙන්වා දීමට අප සූදානමින් සිටින බවද දන්වමු.

### හමුදා නිලධාරීන් දේශපාලන කටයුතුවල නිරතවීම

1. 2014-12-17 වැනිදා ත්‍රිකුණාමලය කොටුව යුද හමුදා කඳවුරේදී, ත්‍රිකුණාමලය 22 සේනාංකාධිපති බ්‍රිගේඩියර් රෝහිත ධර්මසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් සේවාමුක්ත හමුදා සාමාජිකයන් සඳහා රැස්වීමක් පවත්වා තිබේ. එහිදී සේනාංකාධිපතිවරයා විසින් සේවාමුක්ත භටයන් අමතා අවධාරණයෙන් ප්‍රකාශ කර ඇත්තේ යළි යුද්ධයක් ඇති නොවීමට නම් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දිනවිය යුතු බවය.

2. ත්‍රිකුණාමලය යුද හමුදා කඳවුරේ 2වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් මහේෂ් හා 2 අණදෙන නිලධාරී මේජර් සුජිත් යන දෙදෙනා විසින් රණවිරු පවුල්වල සාමාජිකයින් එක්රැස් කොට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට සහාය පළ කරන මාධ්‍ය සාකච්ඡාවක් 2014-12-17 වැනිදා සවස 3.30ට පමණ ආන්දන්කුලම් ප්‍රදේශයේදී පවත්වා තිබේ. යු.හ. 49575 දරන කැබ් රථය මෙහි සංවිධාන කටයුතු සඳහා යොදවාගත් බව අප වෙත වාර්තා වී තිබේ.

### ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් සහ දේපළ මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීම

'2015 ජනාධිපතිවරණය' යන ශීර්ෂය යටතේ 2014-11-21 දාතමින් හා ශ්‍රී ලංකා නිදහස් ජාතික ප්‍රවාහන සේවක සමිතියේ ප්‍රධාන ලේකම් නිමල් අබේසිරි මහතාගේ අත්සනින් යුතුව ලංගම විධායක මට්ටමේ නිලධාරීන් වෙත යවා ඇති නියෝගාත්මක ලිපියක් අප වෙත ලැබී ඇත. එහි පිටපතක් ඔබගේ අවධානය පිණිස ඉදිරිපත් කරමු.

මෙම ලිපිය මගින්, ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් හා දේපළ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට යොදාගත යුතු ආකාරය සම්බන්ධයෙන් ඉහත සඳහන් නිලධාරීන්ට නියෝග කර තිබේ. මේ අන්දමින් නියෝග නිකුත් කිරීමට එම වෘත්තිය

සමිති නිලධාරියාට කිසිදු නෛතික බලයක් නොමැති වුවද දිවයින පුරා පිහිටි ලංගම ඩිපෝ බොහොමයක එම නියෝග ක්‍රියාත්මක වෙමින් තිබෙන බව අප කළ විමර්ශනවලදී හෙළි විය.

මෙම ලිපිය, ලංගමය තුළ සිදුවෙමින් පවතින බරපතළ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ සාක්ෂියක් වන අතර, මෙම තත්ත්වය නිදහස් හා සාධාරණ මැතිවරණයකට බරපතළ අන්දමින් හානි කරන බැවින් මෙම අනීතික නියෝග පිළිනොගන්නා ලෙස අදාළ බලධාරීන්ට වහා දැනුම් දෙන ලෙසද, සේවකයන්ට අයුතු බලපෑම්වලින් තොරව නිදහසේ වෘත්තියෙහි නිරත විය හැකි වාතාවරණය සහතික කරන ලෙසද ඉතා ඕනෑකමින් ඉල්ලමු.

**රාජ්‍ය මාධ්‍යවල සේවකයන් යොදාගෙන දෙසැම්බර් 19 වැනිදා පිටකොටුවේ පැවැත්වූ ප්‍රචාරක ව්‍යාපාරය**

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට සහය පළකිරීම හා විපක්ෂයේ පොදු අපේක්ෂකයා හෙළාදැකීම අරමුණු කරගත් ප්‍රචාරක ව්‍යාපාරයක් දෙසැම්බර් 19 වැනිදා සවස 3.00 සිට 5.00 දක්වා කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිටදී පවත්වන ලදි. රාජ්‍ය මාධ්‍ය ආයතනවල 'ශ්‍රී ලංකා නිදහස් ඒකාබද්ධ ජනමාධ්‍ය සංසදය' නමින් කැඳවා තිබුණු මෙම ප්‍රචාරක ව්‍යාපාරයට ජාතික රූපවාහිනී සංස්ථාව, ගුවන්විදුලි සංස්ථාව, ස්වාධීන රූපවාහිනිය, ලක්හඬ ගුවන්විදුලිය, ලේක්හවුස් ආයතනය සහ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ පානළුව-පාදුක්ක ශාඛාව යන ආයතනවල සේවකයෝ රාජකාරි වේලාව තුළ නිවාඩු ලබාගැනීමකින් තොරව සහභාගී වූහ.

මේ සඳහා අනිවාර්යයෙන් සහභාගී විය යුතු බවට ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය හා ලක්හඬ ගුවන්විදුලියේ සේවකයින්ට ඉහළ නිලධාරීන්ගෙන් සෘජු ලෙසම බලපෑම් එල්ල වූ බව එම සේවකයින් විසින් අප වෙත පැමිණිලි කර තිබේ. සහභාගී නොවන අයගේ රැකියා අහිමි කරන බවට ජාතික රූපවාහිනියේ ඉහළ නිලධාරියකු මෑතකදී බඳවාගත් සේවකයින්ට බලපෑම් කර ඇති බවද වාර්තා වී ඇත.

කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට සහ දුම්රිය ස්ථානය ඇතුළත, මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීම සඳහා මෙම සේවකයින් යොදවා තිබිණි.

මීට අමතරව, ඉහත ආයතන සතු හෝ එම ආයතනවල සේවයට යොදවා ඇති පහත සඳහන් දේපළ මෙම ප්‍රචාරක ව්‍යාපාරය සඳහා යොදාගෙන තිබුණු බව අප විසින් නිරීක්ෂණය කරන ලදි.

1. WP PB 2115 අංක දරන නිසාන් වෑන් රථය (ලේක්හවුස් ආයතනය සතු මෙම වාහනය ප්‍රචාරක පත්‍රිකා ප්‍රවාහනය සඳහා යොදාගෙන තිබිණි.
2. 63-1631 දරන බස් රථය (ජාතික රූපවාහිනිය සතු මෙම බස් රථය පිරිස් ප්‍රවාහනය සඳහා යොදාගෙන තිබිණි.
3. WP LG 5369 අංක දරන කෲ කැබ් රථය (ලක්හඬ ගුවන්විදුලියේ සේවකයින් මෙම රථයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර ප්‍රවාහනය කර එම ස්ථානයේ රඳවා තිබිණි. මෙම රථයේ ඉදිරිපස ස්වාධීන රූපවාහිනී ලාංඡනය සහිත ස්ටිකරය සුදු කඩදාසියකින් ආවරණය කර තිබිණි. )
4. WP LL 4587 දරන ජංගම විකාශන රථය. (මෙම රථය උද්ඝෝෂණය අවස්ථාවේ ශබ්ද විකාශන කටයුතු සඳහා යොදාගන්නා ලදි.

මේ පිළිබඳ ඡායාරූපමය සාක්ෂි ද අප සතුය.

රාජ්‍ය ආයතන සතු සම්පත් හා රාජ්‍ය සේවකයන් රාජකාරි වෙලාව තුළ අයථා අන්දමින් යොදාගෙන සිදුකළ ඉහත ප්‍රචාරක ව්‍යාපාරය මුළුමනින්ම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක්

බව අපගේ නිරීක්ෂණයයි. ඊට අදාළ වගකිවයුත්තන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමු.

**බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා මැතිවරණ ව්‍යාපාරයට සහභාගී වීම.**

ඉහත ප්‍රචාරක ව්‍යාපාරය සඳහා බස්නාහිර පළාතේ ආණ්ඩුකාර අලවි මව්ලානා මහතා සහභාගී විය. මෙය ආණ්ඩුකාරවරුන් මැතිවරණ කටයුතු සඳහා සහභාගී නොවිය යුතු බවට ඔබ විසින් දී තිබෙන උපදෙස්වලට පටහැනි ක්‍රියාවක් බව පෙන්වා දීමට කැමැත්තෙමු. (ඡායාරූපයක් මේ සමග ඉදිරිපත් කර ඇත.)